**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය වියාචනය**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2020 දෙසැම්බර්31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හේතුවෙන් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය වියාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශණයේ සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශණයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මඟින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය,මූල්‍ය කාර්යසාධන ප්‍රකාශණය සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශණය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරියේ ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිත අංක 01 ප්‍රකාරව, අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි රේඛීය අයිතමයක් ලෙස පෙන්නුම් කළ යුතු වුවද, වටිනාකම රු. 14,738,987 ක් වූ පරිගණක මෘදුකාංග දේපල, පිරියත හා උපකරණ වටිනාකම යටතේ මූල්‍ය ප්‍රකාශණවල දක්වා තිබුණු අතර ප්‍රමිතයට අනුව වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුව ද ,මුදල් ශේෂයට රු . 36,672,767 ක බැංකු අයිරාව හිලව් කර ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශණවල දක්වා තිබුණි. | විමසුම සමග එකග වන අතර ඉදිරි මූල්‍ය ප්‍රකාශන පිලියල කිරීමේදී නිවැරදි ආකාරයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමු. | ප්‍රමිත අංක 01 ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි රේඛීය අයිතමයක් ලෙස පෙන්නුම් කළ යුතුවීම සහ වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතුවීම. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට අධිකාරිය විසින් පවරන ලද නඩු 6ක් සහ අධිකාරියට එදිරිව පවරන ලද නඩු 18 ක් පැවතියද, ප්‍රමිත අංක 08 ප්‍රකාරව අසම්භාව්‍ය වගකීමේ ස්වභාවය පිළිබද සංක්ෂිප්ත විස්තරයක්, ප්‍රායෝගික වන්නේ නම් එහි මූල්‍ය බලපෑමේ | විගණන විමසුම සමග එකග වන අතර නඩු කටයුතු සම්බන්ධව තොරතුරු මූල්‍ය අංශය වෙත ලැබී නොමැතිවීම් හේතුවෙන් ප්‍රකාරව හෙළිදරව් කිරීමට සිදුකිරීමට නොහැකි වූ අතර ඉදිරි ගිණුම් වර්ෂයේදී අවශ්‍ය තොරතුරු නීති අංශය මගින් ලබාගෙන අවශ්‍ය ගිණුම් | ප්‍රමිත අංක 08 ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් පිළිබදව අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකළයුතුවීම. |

| | | |
|---|---|---|
| ඇස්තමේන්තුවක් හා ගෙවිය යුතු කාලය සහ ප්‍රතිපූර්ණය විය හැකි බව පිළිබඳ මූල්‍ය ප්‍රකාශණවල හෙළිදරව් කර නොතිබුණි. | ක්‍රියාමාර්ග ගනු ලබයි. | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------------ | -------------------------------- | -------------------- |
| (අ)සමාලෝචිත වර්ෂය අවසාන දිනට සංවර්ධන දේපලවල රු.214,594,528 ක ධාරණ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අස්පෘෂ්‍ය වත්කම් ලෙස පෙන්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | සංවර්ධන දේපලවල ධාරණ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙන්ව දැක්විය යුතුවීම. |
| (ආ) 2017වර්ෂය වන විට රු.173,159,909 ක් ගෙවා අක්කර 1732ක වපසරියකින් යුතු ඉඩම් දෙද්දුව සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගෙන තිබුණ ද, 2021 ඔක්තෝම්බර් 30 දින වන විටත් එහි සංචාරක සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි .තවද 2020 , වර්ෂයවන විට ඉඩම් පැවරීමේ සහතික ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා දී තිබුණද,එම ඉඩම් අධිකාරියේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. එසේම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව, අධිකාරිය සතු ඉඩම්වල වටිනාකම රු.මිලියන 1,618 ක් ලෙසමූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද, පවරා ගැනීම් ,අත්පත් කර ගැනීම් හෝ රජයේ ප්‍රදාන ආකාරයෙන් අයිතිය හිමිවූ එම සියලු ඉඩම් ඇතුළත් ඉඩම් රෙජිස්ටරයක් අධිකාරිය නඩත්තු කර නොතිබුණි. | 2020 වර්ෂයට අදාල මූල්‍ය වාර්තා පිළියල කිරීම සිදුකරන අවස්ථාව වන විට විමසුමෙහි සඳහන් ආකාරයට ඉඩම්වල වටිනාකම පොත් වලට වාර්තා කිරීම සඳහා අදාල තහවුරු තොරතුරු මූල්‍ය අංශයට ලැබී නොමැත. කෙසේ වුවද ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුකිරීමට එකඟවෙමු. | පවරාගත් ඉඩම් වත්කම් ලෙස ගිණුම්ගත කළයුතුවීම සහ ඉඩම් රෙජිස්ටරයක් නඩත්තු කළයුතුවීම. |

| | | |
|---|---|---|
| (ඇ)2016 වර්ෂයේ සිට සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් එක් එක් පළාත් සභා විසින් ක්‍රියාත්මක කළ වැඩසටහන් වෙනුවෙන් ලබාදුන් මුදල් රු.22,516,037 ක්, දරන ලද වර්ෂවල වියදම් ලෙස හඳුනාගැනීම වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි. | විමසුමේ සඳහන් ව්‍යාපෘතිවල වැඩ නිම කල තොරතුරු අවශ්‍ය ගිණුම් ගෙවීම් කටයුතු සඳහා ගිණුම් පිළියල කරන අවස්ථාව වන විට මූල්‍ය කළමනාකරණ අංශ වෙත අදාල අංශ මගින් ලබා දී නොමැත. කෙසේ වුවද එම තොරතුරු ලබාගෙන අවශ්‍ය වාර්තා කිරීම සිදුකිරීමට එකගවෙමු. | අධිකාරියට අයිතිය නොපැවරෙන බැවින් දරන ලද වර්ෂවල වියදම් ලෙස හඳුනාගත යුතුවීම. |

## 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| **(අ) ලැබිය යුතු ගිණුම්** | | | | | |
| (i) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | 108,336,568 | 0 | 108,336,568 | මෙම ශේෂ සැසඳීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | පියවර ගතයුතුවීම. |
| (ii) ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය | 8,782,635 | 108,336,570 | 99,533,935 | මෙම ශේෂ සැසඳීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | -එම- |
| (iii) ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය | 263,223 | 0 | 263,223 | මෙම ශේෂ සැසඳීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | -එම- |
| (iv) සංචාරක සංවර්ධන අරමුදල | 3,975,260 | 4,675,168 | 699,908 | මෙම ශේෂ සැසඳීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | -එම-. |
| **(ආ)ගෙවිය යුතු ගිණුම්** | | | | | |
| (i) ශ්‍රී ලංකා | 6,512,810 | 0 | 6,512,810 | මෙම ශේෂ | ශේෂ සැසඳීමට |

| | | | | | |
|---|---|---|---|---|---|
| සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය | | | | සැසඳීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | පියවර ගතයුතුවීම. |
| (ii) සංචාරක සංවර්ධන අරමුදල | 703,607 | 470,864 | 232,743 | මෙම ශේෂ සැසඳීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | ශේෂ සැසඳීමට පියවර ගතයුතුවීම. |
| (ඇ) ඉඩම් | 1,803,501,357 | 1,803,072,529 | 428,828 | සංසන්දනය සිදුකල ආකාරය පිළිබද පැහැදිලි කිරීමක් ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලාසිටිමු. | ඉඩම්වල ගිණුම්ගත කළ වටිනාකම් උපලේඛණ සමග සැසදිය යුතුවීම. |
| (ඈ)වෙළද ණයගැති යන් | 210,359,144 | 209,988,954 | 370,190 | විමසුම සමග එකග වන අතර නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නෙමු. | ගිණුම්ගත කළ වටිනාකම් උපලේඛණ සමග සැසදිය යුතුවීම. |
| (ඉ)වෙනත් ආදායම් | 1,369,492 | 1,101,349 | 268,143 | විමසුම සමග එකගවන අතර නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නෙමු. | -එම- |

## 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂයය | මුදල රු. (මිලියන) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ----------- | ----------- | ----------------------- | ----------------- | ------------------ |
| (අ)කෙරීගෙන යන වැඩ | 120.8 | - වියදම් බිල්පත්‍ර<br>-උපයෝගී ලියවිලි | මෙම තොරතුරු අධිකාරියේ දේශීය සංචාර (DT&CR) අංශයෙන් ලබාගත හැකි බව කාරුණිකව සලකන්න. | අවශ්‍ය ලිපිලේඛණ සහ ගොණු නඩත්තු කළයුතුවීම. |
| (ආ)සංවර්ධන පිරිවැය | 214.5 | - උපයෝගී ලියවිලි<br>-විස්තරාත්මක උපලේඛන | පිළිතුරු ලබා දී නොතිබුණි. | උපයෝගී ලියවිලි සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළයුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ)ආයෝජන | 54.6 | - ආයෝජන සහතික | මෙම ශේෂ ගිණුම් වලින් කපාගැනීම සඳහා මණ්ඩලීය අනුමැතිය මතම හා භාණ්ඩාගාරයේ අනුමැතියට යොමුකර ඇත. | උපයෝගී ලියවිලි ඉදිරිපත් කළයුතුවීම. |
| (ඇ)කල්පිටිය හිමිකම් | 46.4 | -වත්කම් වල විස්තර | පිළිතුරු ලබා දී නොතිබුණි. | වත්කම් වල විස්තර ඉදිරිපත් කළයුතුවීම. |
| (ඉ)ප්‍රාග්ධන සංචිතය | (243.7) | -විස්තරාත්මක උපලේඛන | මෙම ශේෂ ගිණුම් වලින් කපාගැනීම සඳහා මණ්ඩලීය අනුමැතිය මතම හා භාණ්ඩාගාරයේ අනුමැතියට යොමුකර ඇත. | විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළයුතුවීම. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට වූ වෙළඳ ණයගැති ශේෂය රු. 210,359,144 ක් විය. ඉන් වර්ෂ 4කට වඩා පැරණි ණයගැති ශේෂ වටිනාකම රු. 54,918,514 ක් වූ අතර, වර්ෂ 3ක සිට 4 ක් දක්වා පැරණි ණයගැති ශේෂ වටිනාකම රු. 24,976,435 ක් වූ නමුත් මෙකී ණය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | විගණන විමසුම සමග එකග වන අතර එම ශේෂ සම්බන්ධ නිකේතන කළමනාකරණ අංශය සමග සාකච්ඡා කරඅවශ්‍ය පියවර ගනිමු. | හිඟ ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතුවීම. |
| (ආ) 1989 සිට 2007 වර්ෂය දක්වා විදේශයන්හි | ලිඛිත සාක්ෂි නොමැති මෙම ශේෂ සම්බන්ධව මණ්ඩලිය අනුමැතියට යටත්ව ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය පියවර | මුදල් අමාත්‍යාංශ අනුමැතිය සහිතව ගිණුම් වලින් ඉවත් |

| | | |
|---|---|---|
| කාර්යාල කුලී වෙනුවෙන් තැන්පත් කරන ලද රු3.,661,031ක ලැබිය යුතු තැන්පතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ගනු ලැබේ. | කිරීමට පියවර ගත යුතු වීම. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ 11ක් පැරණි රු. 333,694 ක විදේශ අත්තිකාරම් ශේෂය සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා පියවා නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අත්තිකාරම් ශේෂය පියවීමට කටයුතු කළයුතුවීම. |
| (ආ) පාසිකුඩා ජාතික නිවාඩු නිකේතන පරිශ්‍රය තුළ ස්ථාපිත මලද්‍රව්‍ය හා අපවහන ජලය පිරිසිදු කිරීමේ පද්ධතියට අදාළව හෝටල් 14කින් 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු 246,730,325 .ක් අයකරගෙන අදාල සමාගමට ගෙවීමට කටයුතු කර නොතිබුණි. | එම්.එස්.ලක්දියත පුද්ගලික සමාගම සමග එකග වී ඇති අපවහන පිරිපහදු කිරීමේ ඒකකයේ ඒකක අනුපාතය සැළකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතින අතර මාසික බිල්පත් ගෙවීමට මැලිකමක් දක්වන බවට පාසිකුඩා ජාතික නිවාඩු නිකේතනයෙහි හෝටල් හිමියන් දිගින් දිගටම පැමිණිලි කළහ. එම නිසා බොහෝ සාකච්ජා වලින් පසු අනාගත අපවහන පිරිපහදු කිරීම සඳහා වූ නිර්දේශයන් සමග තාක්ෂණික හා මූල්‍ය ඇගයීම සඳහා උපදේශකයෙකු පත්කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය තීරණය කළේය. උපදේශක සමාගම ජාතික තරගකාරී ලංසු කැදවීමකින් තෝරාගත් අතර එම කර්තව්‍යය ප්‍රදානය කරන ලදී . උපදේශකවරයා සියලුම | ගෙවිය යුතු මුදල් පියවිය යුතුවීම. |

පාර්ශකවරුන් සමග සාකච්ඡා කිහිපයක් පවත්වා, ස්ථානීය පරීක්ෂා කිරීම් සහ තාක්ෂණික හා මූල්‍ය ඇගයීම සිදුකර, පළමුව කෙටුම්පත් වාර්ථාව අවසන් අදියරයේ පවතී. සියලුම් පාර්ශකවරුන් සමග සාකච්ඡා කිරීමෙන් පසු ඉදිරි පියවරයන් අවසන් කරන අතර මාණ්ඩලික අනුමැතිය ලබාගැනීමෙන් පසුව නිර්දේශ ක්‍රියාත්මක කරනු ඇත.
කොවිඩ් 19 වසංගත හේතුවෙන් 2020 සහ 2021 දී විටින් විට රට වසා දැමීම නිසා මෙම ක්‍රියාවලිය ප්‍රමාදවිය.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | රූ. | | |
| (අ) 2005 අංක 38දරන සංචාරක කටයුතු පනත | | | |
| (i) පනතේ 6.1 (අ) සහ (ආ) වගන්ති | සංචාරක සංවර්ධනය සඳහා යෝජිත දිගුකාලීන ඉලක්ක සහ සිව් අවුරුදු සැලැස්මක් සකස්කර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අමාත්‍යාංශය විසින් සකස්කළ 2017-2020 උපක්‍රමික සැලසුම් 2020 වසර සඳහාද දිගු කරන ලදී. | සංචාරක සංවර්ධනය සඳහා දිගුකාලීන ඉලක්ක සහ සිව් අවුරුදු සැලැස්මක් සකස්කළ යුතුවීම. |
| (ii) පනතේ 26(3) වගන්තිය | ප්‍රකාශිත යම් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත කරගෙන යාහැකි සංචාරක කටයුතු, වාණිජ්‍ය හා වෙනත් කටයුතු නියම කරමින් නියෝග සකස් කළ යුතු වුව ද, ප්‍රකාශිත සංචාරක ප්‍රදේශ 11කට අදාලව 2021ඔක්තෝම්බර් 30 දින වන විටත් නියෝග සාදා නොතිබුණි. | ප්‍රකාශිත යම් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුලත කරගෙන යා හැකි සංචාරක කටයුතු ,වාණිජ්‍ය හා වෙනත් කටයුතු නියෝග කරමින් ක්‍රියාත්මක කිරීම මූලික සැලසුම අනුව සිදු කරනු ලබයි.<br>එසේ ක්‍රියාත්මක වන සංචාරක සංවර්ධන ප්‍රදේශ ව්‍යාපෘති බොහෝමයක් වන අතර මෙහි නිශ්චිත ප්‍රදේශයක් සඳහන් කර නොමැත. | පනතේ විධි විධාන ප්‍රකාරව නියෝග සකස් කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනත | සමාලෝචිත වර්ෂයේදී වටිනාකම රු.බිලියන 1 ක් කෙටිකාලීන ආයෝජනවල තැන්පත් කිරීම සඳහා අදාල අමාත්‍යවරයාගේ එකගත්වය සහිතව මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | පිළිතුරක් ලබා දී නොමැත. | ආයෝජනවල මුදල් තැන්පත් කිරීමේ දී අවශ්‍ය අනුමැතීන් ලබා ගතයුතු වීම. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------------- | | | |
| (i) මුදල් රෙගුලාසි 396 | කාලපරිච්ඡේදය හදුනා නොගත් ගෙවීමට ඉදිරිපත් නොකළ රු. 3,441,809 වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් පිළිබද උපලේඛනයන් ඔබ වෙත ලබා දී ඇති අතර එම ශේෂ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට එකගවෙමු. | ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුවීම. |
| (ii)මුදල් රෙගුලාසි 757 | වටිනාකම රු.1,880,781 ක් වූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මෙම පුස්තකාල පොත්වල හිමිකම අධිකාරිය සතුව පොත්වල පෙන්වුවද දැනට මෙම පොත් භෞතික වහාරයේ පවතින්නේ ශ්‍රී ලංකා හෝටල් කළමණාකරන ආයතනය සතුවය. එසේ හෙයින් මෙම පොත්වල හිමිකමද ඔවුන් වෙත පැවරීමට මේ වන විට මූලික පියවර ගෙන ඇත. | පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකළ යුතුවීම. |
| (ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි | අධිකාරිය විසින් පවත්වා ගෙන යන ලබන පරිසනක ආශ්‍රිතව (MS-EXCELL) පිළියල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය ඔබ වෙත ඉදිරිපත් කර ඇති අතර භාණ්ඩාගාර | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු වීම. |

චක්‍රලේඛන අනුව එය පිලියල කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගන්නෙමු.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍යප්‍රතිඵල

-----------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.120,150,798 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු. 119,458,429ක අතිරික්තයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 239,609,227ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ සංචාරක සංවර්ධන බදු රු.223,970,698 කින් සහ අපගමන බදු ආදායම් රු.54,465,786 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 3.1 හඳුනාගත් පාඩු

------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| . 2013 වර්ෂයේ දී පූර්ව ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ආරම්භ කළ කැලිඩෝ වෙරළ උද්‍යාන ව්‍යාපෘතියේ එතෙක් කළ වැඩ ප්‍රමාණය මුහුද බාදනයට ළක්වීම නිසා විනාශ වී ගොස් තිබූ නමුත් 2016 වර්ෂය තෙක් කොන්ත්‍රාත්කරුට ගෙවූ අත්තිකාරම් මුදල් රු.19,990,021 ක් සහ කෙරීගෙන යන වැඩ වියදම් රු.1,247,206 ක් වශයෙන් එකතුව රු.21,237,227 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ද මූල්‍ය ප්‍රකාශණවල ඉදිරියට ගෙනවිත් තිබුණි . | . 09-02-2021දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා තීරණය අනුව සමස්ථ පිරිවැය සංචාරක තොරතුරු කාර්යාංශ ප්‍රාග්ධන පිරිවැය ලෙස හිලව් කිරීමට අනුමැතිය ලැබී ඇත . ඉහත පිරිවැය ශේෂ වූ පිරිවැය වෙ.පසුගිය විගණන සහ කළමනාකරණ කමිටුව විසින් ගත් තීරණ අනුව ඉහත පිරිවැය අධ්‍යක්ෂ/මානව සම්පත්ගෙන් සැදුම් ලත් කමිටුවක නිර්දේශයන් අනුව මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් තීරණයක් ගන්නා බව සඳහන් කර ඇත. පවතින වසංගත තත්වය අනුව මෙම නිරීෂණ වාර්තාවඉදිරිපත් කිරීමට පමාවී ඇත .ඉදිරි අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිපත් කිරීමෙන් අනතුරු මෙම පිරිවැය සම්බන්ධව සලකා බලනු ඇත. | ගිණුම්වල අවශ්‍ය ගැලපීම් නිසි අනුමැතීන් සහිතව සිදුකළ යුතුවීම. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| (අ) දුන්හිඳ දිය ඇල්ල මාර්ගයේ වෙළඳකුටි 20ක් ඉදිකිරීම සඳහා 2017 පෙබරවාරි ආරම්භ කළ ව්‍යාපෘතියේ 2021ජූනි 30දින වන විට එකතුව රු 2,864,289.ක වියදමකින් කඩකාමර 10ක් පමණක් ඉදිකර තිබුණි. ප්‍රාදේශීය සභාවෙන් වියදම් දැරූ පසු අධිකාරිය විසින් එය ප්‍රතිපූරණය කරන පදනමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු අතර අදාල ප්‍රාදේශීය සභාවට මුදල් නොමැතිවීම නිසා ඉදිකිරීම් නැවතී තිබුණි.<br>. | - 2017 මාණ්ඩලික සාකච්ඡාවට අනුව දුන්හිඳ දිය ඇල්ල මාර්ගයේ වෙළඳකුටි 20ක් ඉදිකිරීමට අනුමැතිය ලැබුණි. ක්‍රියාත්මක කරන ආයතනය වූයේ සොරණාතොට ප්‍රාදේශීය සභාවයි.<br><br>- කොන්ත්‍රාත් පදනම මත ඉදිකිරීමට වියදම අධික නිසා ප්‍රාදේශීය සභාවේ සෘජු මැදිහත්වීමෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.<br><br>- ඒ අනුව ඉදිකිරීම් සඳහා ගෙවීම මුදල් ප්‍රතිපූර්ණය කිරීම යටතේ ගෙවන ලදී.<br><br>- 2018.07.11 වනවිට ප්‍රාදේශීය සභාවට මුදල් නොමැති බැවින් අමුද්‍රව්‍ය හා ඉදිකිරීම් වියදම් දැරීමට නොහැකි බව දන්වන ලදී.<br><br>- මේ අනුව අදාළ ව්‍යාපෘතිය 2021.03.23 දක්වා ප්‍රමාද වෙන ලදී. | ව්‍යාපෘතිය ප්‍රමාදවීම් වලින් තොරව සම්පූර්ණ කළයුතුවීම. |

| | | |
|---|---|---|
| (ආ) මදුරන්කුලියේ සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානයක් (විවේකාංගනයක්) ඉදිකිරීමට 2016 වර්ෂය දක්වා රු . 6,771,807ක් අධිකාරිය විසින් වයඹ පළාත් සභාවට ගෙවා තිබුණ ද, පසුව ඉදිරිපත් කළ බිල්පත්‍රවල දෝෂ පැවතීම නිසා අධිකාරිය පළාත් සභාවට වියදම් ප්‍රතිපූරණය නොකිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබුණි. | - මාණ්ඩලික අනුමැතියට අනුව රු.මි.15ක මූලික එකගතාවයෙන් 2015 වසරේ දී මෙම ව්‍යාපෘතිය ආරම්භ වී ඇති අතර,මෙතෙක් පියවා ඇති මුළු මුදල රු.මි .6.7කි.<br>- ඉතිරි මුදල් ගෙවීම සඳහා ඉදිරිපත්කළ ඉන්වොයිසි හා ප්‍රමාන පත්‍ර ඉංජිනේරු සහතික කිරීමේ දෝෂ පවතින බැවින් මුදල් නොගෙවන ලදී.<br>- ව්‍යාපෘතිය ආරම්භයේ යෝජනා කළ ඉදිකිරීම්වලට අමතරව මූලික සැලැස්ම වෙනස්වන ආකාරයට ඉදිකිරීම් පූර්ව අනුමැතියකින් තොරව සිදුකර ඇති බව තාක්ෂණික නිලධාරීන් හඳුනා ගෙන ඇත.<br>- කරුණු පැහැදිලි කිරීමේ ඉල්ලීමට ප්‍රාදේශීය සභාව ප්‍රතිචාර ලබා නොදුන් අතර අප අමාත්‍යාංශයේ සහය ඉල්ලා සිටින ලදී. | ව්‍යාපෘතිය ප්‍රමාදවීම්වලින් තොරව සම්පූර්ණ කළයුතුවීම. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය සතු ජාතික නිවාඩු නිකේතන 04 හි පසුගිය වර්ෂයේ එකතු අලාභය රු. 27,003,697 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ එකතු අලාභය රු. 46,016,794 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එකතු අලාභය සියයට 70 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂය තුළ සංවර්ධන කාර්යයන් 26 ක් සැලසුම් කර තිබුණ ද, ඉන් කාර්යයන් 11 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒවායින් කාර්යයන් 8 ක පමණක් භෞතික ප්‍රගතිය සියයට 75 ට වඩා වැඩිවුණි. | • ප්‍රසම්පාදනයේ වැඩ සහ උපදේශනය ප්‍රමාදවීම.<br>• ලංසුකරුවන්ගේ ප්‍රතිචාර නොදැක්වූ ලංසු හේතුවෙන් නැවත ලංසු කැඳවීම.<br>• කොවිඩ් 19 වසංගත හේතුවෙන් 2020 සහ 2021 දී විටින් විට රට වසාදැමීම.<br>අයවැය සීමා කිරීම සහ සංචාරක සංවර්ධන බදු අදායම අඩුවීම හේතුවන් විවේචනාත්මක නොවන වැඩවල පිරිවැය අඩු කිරීමට ගත් කළමනාකරණ තීරණය | ජාතික නිවාඩු නිකේතන ලාභදායී වන අයුරින් මෙහෙයවීම සහ සැලසුම් කළ පරිදි සංවර්ධන කාර්යයන් ඉටුකළ යුතුවීම. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංචාරක කටයුතු සඳහා නිදහස් ප්‍රදාන වශයෙන් 2010සහ 2012 වර්ෂයන්වලදී කල්පිටියේ දූපත් 12ක ඉඩම් අක්කර 2055.87ක භූමි ප්‍රමාණයක් අධිකාරියට ලැබී තිබුණි. එම දූපත් 12න් දූපත් 05කට අයත් ඉඩම් අක්කර 206.74ක් පමණක් 2010, 2011 සහ 2020වර්ෂවලදී සමාගම් 03ට බදු දීමට කටයුතු කර තිබුණු නමුත් එම කිසිදු සමාගමක් 2021 ඔක්තෝම්බර් 30දින වන විටත් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි .ඉතිරි දූපත් 07හි ඉඩම් අක්කර 1849.13ක් ප්‍රදාන වශයෙන් ලැබුණු දිනයේ සිට 2021 ඔක්තෝම්බර් 30 දක්වාම සංචාරක සංවර්ධන කටයුතු සඳහා යොදවාගෙන නොතිබුණි. | දූපත් 12න් දූපත් 05 ක් 2021 ඔක්තෝම්බර් 30 දින වන විට බදු දීමට කටයුතු කර ඇති අතර තවත් දූපත් 03 ක් බදු දීම සඳහා අනුමැතිය ලැබී ඇත. | නිදහස් ප්‍රදාන වශයෙන් ලද ඉඩම් සංචාරක සංවර්ධන කටයුතු සඳහා යොදා ගතයුතු වීම. |
| (ආ) යාල පලටුපාන වනජීවී සංචාරක කලාපයේ සංචාරක සංවර්ධන කටයුතු සඳහා අධිකාරියට අක්කර 1,106 ක් 1975 වර්ෂයේ සිට අයිතිව පැවති අතර 2014 වර්ෂයේදී සමාගම් 7ක් සහ 2019 වර්ෂයේදී තවත් සමාගමක් වශයෙන් අක්කර 69ක් සමාගම් 08කට බදු දී තිබුණි . එහෙත් 2021 ඔක්තෝම්බර් 30දින වන විට සමාගම් 04ක් පමණක් මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි. | සමාගම් 02ක් මෙහෙයුම් කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති අතර සමාගම් 02ක ඉදිකිරීම් සිදුකරමින් පවතී. එක් සමාගමකට කාලය දීර්ඝ කර ඇත. තවත් ආයෝජකයෙක් සමග ගිවිසුම් අත්සන් කරන ලද්දේ 2020.09.30 දිනදීය. | බදු දුන් සමාගම් මෙහෙයුම් කටයුතු ආරම්භ කරවීමට පෙළඹවීම් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) 2011 සහ 2014වර්ෂ වලදි අධිකාරිය විසින් කුච්චවෙලි සංචාරක සංවර්ධන ව්‍යාපෘතින් සඳහා පවරා ගත් ඉඩම් අක්කර 510.086ක් වූ භූමි ප්‍රමාණයෙන් ඉඩම් අක්කර 49 ක් පමණක් සමාගම් 3කට බදු දී තිබුණි .එසේ බදු දී තිබුණු සමාගම් 3 න් ද, එක් සමාගමක් ගිවිසුම් වලට එළඹ තිබුණේ 2021මැයි මාසයේදී | ආයෝජකයින් 04 දෙනෙක් විසින් නව ආයෝජන ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ඇති අතර අක්කර 137 ක් පමණ ඇතුන් සංරක්ෂණ කලාපය සඳහා වෙන්කර ඇත. | ඉඩම් සංචාරක සංවර්ධන කටයුතු සඳහා බදු දීමට කටයුතු කළයුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | වූ අතර 2011දී අක්කර 20ක් බදු ගත් තවත් සමාගමක් විගණන දිනය වූ 2021ඔක්තෝම්බර් 30වන විටත් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි .ඒ අනුව කුච්චවේලි ව්‍යාපෘතියේ ඉඩම් අක්කර 461.086ක් 2021 ඔක්තෝම්බර් 30 දින වන විටද, සංචාරක සංවර්ධන කටයුතු සඳහා බදු දී නොතිබුණි. | | |
| (ඇ) | අධිකාරිය සතු තානායම් 37 න් තානායම් 9 ක් මාස 05 ක සිට මාස 52 ක් දක්වා කාලයක් බදු දී නොතිබීම හේතුවෙන් එකී දේපල ඌන උපයෝජිතව පැවතුණි. | අනාගත ප්‍රතිචාර දක්වන ආයෝජකයින් තෝරාගැනීමට කිහිපවරක් ටෙන්ඩර් ඉදිරිපත් කළ නමුත් ප්‍රතිචාර නොදක්වන ලංසු ලැබිණි.<br>ආක්‍රමණය හේතුවෙන් ඉඩම් ගැටලු ඇතිවීම. | තානායම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |